# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2491/67 - 2026 ජූනි මස 05 වැනි සිකුරාදා - 2026.06.05**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**කලාපීය සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම**

2000 අංක 49 දරන පනත මගින් සංශෝධිත 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 8(1) වගන්තිය යටතේ නියෝගය

2000 අංක 49 දරන පනත මගින් සංශෝධිත, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 8(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මම, පහත සඳහන් උපලේඛනය මගින් සඳහන්කර දක්වා ඇති ප්‍රදේශය කලාපීය භෞතික සැලැස්ම සම්පාදනය කිරීමේ අරමුණ උදෙසා කලාපීය සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමි.

බිමල් නිරෝෂන් රත්නායක (පා.ම.),
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 මැයි මස 20 වැනි දින,
ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල, සෙත්සිරිපාය අදියර - II,
බත්තරමුල්ල.

උපලේඛනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 8 වැනි උපලේඛනය මගින් සඳහන්කර දක්වා ඇති උතුරු පළාතේ පරිපාලන සීමාව තුළ පිහිටි ප්‍රදේශය.


1A - G 46946 — 43 (2026/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උතුරු පළාතේ කලාපීය සංවර්ධන ප්‍රදේශය සඳහා කලාපීය භෞතික සැලැස්ම සම්පාදනය කිරීම**

**(2000 අංක 49 දරන පනත මගින් සංශෝධිත)**
**1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 21(2) (අ) වගන්තිය යටතේ නියෝගය**

උතුරු පළාතේ කලාපීය සංවර්ධන ප්‍රදේශය සඳහා කලාපීය භෞතික සැලැස්ම සම්පාදනය කිරීම ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මම, 2000 අංක 49 දරන පනත මගින් සංශෝධිත, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 21(2) (අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි සඳහන් කර දක්වා ඇති දිනයේ සිට මාස 30 ක කාලයක් තුළ උතුරු පළාත් කලාපීය සංවර්ධන ප්‍රදේශය සඳහා කලාපීය භෞතික සැලැස්මක් සම්පාදනය කරන ලෙස මෙමගින් නියෝග කරමි.

EOG 06 - 0056/1

---

**කලාපීය සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම**

2000 අංක 49 දරන පනත මගින් සංශෝධිත
1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 8(1) වගන්තිය යටතේ නියෝගය

2000 අංක 49 දරන පනත මගින් සංශෝධිත, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 8(1) වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මම, පහත සඳහන් උපලේඛනය මගින් සඳහන් කර දක්වා ඇති ප්‍රදේශය කලාපීය භෞතික සැලැස්ම සම්පාදනය කිරීමේ අරමුණ උදෙසා කලාපීය සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමි.

බිමල් නිරෝෂන් රත්නායක (පා.ම.),
ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය.

2026 මැයි මස 20 වැනි දින,
ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය,
6 වන මහල, සෙත්සිරිපාය අදියර - II,
බත්තරමුල්ල.

උපලේඛනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ 8 වැනි උපලේඛනය මගින් සඳහන් කර දක්වා ඇති වයඹ පළාතේ පරිපාලන සීමාව තුළ පිහිටි ප්‍රදේශය.

**වයඹ පළාතේ කලාපීය සංවර්ධන ප්‍රදේශය සඳහා කලාපීය භෞතික සැලැස්ම සම්පාදනය කිරීම**

**(2000 අංක 49 දරන පනත මගින් සංශෝධිත)**
**1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 21(2) (අ) වගන්තිය යටතේ නියෝගය**

වයඹ පළාතේ කලාපීය සංවර්ධන ප්‍රදේශය සඳහා කලාපීය භෞතික සැලැස්ම සම්පාදනය කිරීම ප්‍රවාහන, මහාමාර්ග හා නාගරික සංවර්ධන අමාත්‍ය බිමල් නිරෝෂන් රත්නායක වන මම, 2000 අංක 49 දරන පනත මගින් සංශෝධිත, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 21(2) (අ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි සඳහන්කර දක්වා ඇති දිනයේ සිට මාස 24 ක කාලයක් තුළ වයඹ පළාත් කලාපීය සංවර්ධන ප්‍රදේශය සඳහා කලාපීය භෞතික සැලැස්මක් සම්පාදනය කරන ලෙස මෙමගින් නියෝග කරමි.

EOG 06 - 0056/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.